# රැකියා ඇබෑර්තු

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය
## (බස්නාහිර පළාත)

# රසායනාගාර භාර නිලධාරී
# සේවාව ලබාගැනීම

තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය** :- සාකච්ඡා කර තීරණය කෙරේ

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද** :- රසායන විද්‍යාව විෂයක් වශයෙන් වූ විද්‍යාවේදී උපාධිය/ කෘෂිකර්ම/ ජෛව තාක්ෂණ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද.

**වෙනත් කරුණු :-**

1. සේවාවක් ලබා ගැනීමකි.
2. සේවාව ලබාදෙනු ලබන අයදුම්කරුවන්ගේ දෛනික දීමනාවෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර, ( 15% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා ද, 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහා ද) අධිකාරිය විසින් දරනු ලබයි.
3. සේවාව ලබාදෙනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසි වලට අවනත විය යුතුය.

**සේවාව ලබා ගැනීමේ ක්‍රමය :-** අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

**ඉල්ලුම් කළ යුතු පිළිවෙල :-** සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍ර 2023/12/ 08 වන දිනට හෝ ඊට පෙර, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝවිල, කරදියාන, පිළියන්දල යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගීවීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලැබෙන අතර, කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.)**
**2023.12.01 දින**